ත්‍රිකුණාමලය නගර සභාව

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

---------------------------------------

1.1 සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 සැප්තැම්බර් 30 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබූ අතර, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 නොවැම්බර් 29 දින ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය

----------

මෙම වාර්තාවේ 1.3 ඡේදය යටතේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ත්‍රිකුණාමලය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූල නොවීම

------------------------------------------------------------------------------

පළාත පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ 2014 ජනවාරි 27 දිනැති අංක පිඑල්/05/බිඑ/SLPSAS දරන චක්‍රලේඛය පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

---------------------------

ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන වල හෙළදරවු කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු

---------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය විසින් 2010, 2011 සහ 2013 වර්ෂ තුලදී පරිත්‍යාග කරන ලද වාහන හයක වටිනාකම නිශ්චය කොට ගිනුම් වලට ගෙන නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට වූ අතැති ආයුර්වේද ඖෂධ තොග වටිනාකම නිශ්චය කොට ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ඇ) සභාවේ සේවක වැටුප් වලින් අඩුකර ගත් විශ්‍රාම දායක මුදල් වශයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.7,150,382 ක මුදලක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ඈ) සෝසාතකාගාර හිඟ කුලී රු.143,349 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සභාවට සපයන ලද ජලය සඳහා 1991 වර්ෂයේ සිට ශ්‍රී ලංකා නාවික හමුදාවට ගෙවිය යුතු රු.4,645,367 ක් මූල්‍ය ප්‍රකාශන වල පෙන්වා නොතිබුණි.

(ඊ) කාර්ය මණ්ඩල ණය ලේඛනයට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට අයවිමට තිබූ කාර්ය මණ්ඩල ණය ප්‍රමාණය රු.15,893,361 ක් වූ නමුත් එය මූල්‍ය ප්‍රකාශන වලට ගෙන තිබුනේ රු.15,222,733 ක් වශයෙනි. මේ නිසා කාර්ය මණ්ඩල ණය ශේෂය රු.670,628 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) 2013 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රැඳවුම් මුදල් රු.1,495,345 ක් සහ අවසාන බිල් සඳහා ගොවිය යුතු රු.668,257 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ඌ) සභාව විසින් පවත්වාගෙන ගොස් තිබූ වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ගිණුම් ශේෂ හතරක වටිනාකම රු.94,791,767 ක් වූ නමුත් එය මූල්‍ය ප්‍රකාශන වලට ගෙන තිබුනේ රු.78,881,410 ක් වශයෙනි. මේ නිසා ලැබිය යුතු ගිණුම් ශේෂය රු.15,910,357 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(එ) සභාව විසින් පවත්වා ගෙන ගොස් තිබූ වාර්තා අනුව ගෙවිය යුතු ගිණුම් ශේෂ දෙකක වටිනාකම රු.23,965,613 ක් වූ නමුත් එය මූල්‍ය ප්‍රකාශන වලට ගෙන තිබුණේ රු.49,155,732 ක් වශයෙනි. මේ නිසා ගෙවි යුතු ගිනුම් ශේෂය රු.25,190,119 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

1.3.4 අවිනිශ්චිත ගිණුම

------------------------

නිරවුල් කිරිමට කටයුතු කිරිමෙන් තොරව අවිනිශ්චිත ගිණුමේ දැක්වුණු රු.30,153,029 ක් වූ බැර ශේෂය 2010 වසරේ සිට දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

1.3.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

----------------------------------------

පහත සඳහන් නිරික්ෂණය සිදුකෙරේ.

(අ) 2003 වසරේ පටත් ලැබිය යුතු ගිණුම් වශයෙන් දැක්වුණු එකතුව රු.161,644 ක් වූ මුදලක් අයකර ගැනිමට හෝ කපා හැරිමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2008 වසරේ පටන් ගෙවිය යුතු ගිනුම් වශයෙන් දැක්වුණු එකතුව රු.4,557,338 ක මුදලක් නිරවුල් කිරිමට හෝ කපා හැරිමට කටයුතු කර නොතිබුණි.

1.3.6 විගණනය සඳහා සාක්ෂි

-----------------------------

පහත සඳහන් ගිනුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂය | මුදල | ලබා නොදුන් සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ස්ථාවර වත්කම් | 76,392,129 | ශේෂ තහවුරු කිරිම්, කාල විශ්ලේෂණ සහ විස්තරාත්මක උපලේඛණ |
| උපයෝගි සේවා සඳහා ණය | 5,010,261 | |
| කාර්ය මණ්ඩල ණය | 15,222,733 | |
| අයකළ යුතු උපයෝගි සේවා | 110,137 | |
| ආදායම් ණයගැතියෝ | 90,357,650 | |
| පෙර ගෙවුම් | 2,768,536 | |
| ණය හිමියෝ | 1,751,117 | |
| කලින් ලැබිම් | 4,533,938 | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 73,598,712 | |

1.3.7 නීති, රීති, සහ රෙගුලාසි වලට අනුකූල නොවිම්

---------------------------------------------------------

විගණනයේදි නිරික්ෂණය වු නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවිම් පහත දැක්වේ.

| (අ) නිති, රිති සහ රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවිම් |
|---|---|---|
| නැගෙනහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි | | |
| පි.එෆ්.ආර්.104 | - | මුල්‍ය පාලනය පහසු කිරිම සඳහා කාර්යයන් පැවරීමේ ක්‍රියාවලියක් සකසා නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) පළාත් පාලන අමාත්‍යාංශයේ 2005 - නොවැම්බර් 05 දිනැති චක්‍රලේඛයේ 3 ඡේදය | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපනය කිරිම සඳහා විගණිත දිනය වූ 2015 ඔක්තෝබර් 10 දින දක්වාම කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචණය

---------------------------

2.1 මූල්‍ය ප්‍රතිපල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,837,240 ක් වූ අතර ඊට අනුරූපව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,441,990 ක් විය.

2.2 අයවැය පාලනය

---------------------

අයවැයගත ආදායහ සහ වියදම සහ තත්‍ය ආදායම හා වියදම අතර සියයට 5 සිට සියයට 100 දක්වා වූ විචලනයක් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛණය ඵලදායි පාලන කාරකයක් වශයෙන් උපයෝගි කරගෙන නොතිබූ බැව් නිරීක්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

-------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම්

-----------------------------------------------------------------

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ හිටි ආදායම් වලට අදාල තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තත්‍ය | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ශේෂය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් බදු | 55,000 | 31,441 | 69,090 |
| බදු කුලි | 23,420 | 19,997 | 11,855 |
| බලපත්‍ර ගාස්තු | 215,510 | 94,710 | 9,134 |

2.3.2 හිඟ කුලි

-----------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

i. සභාවට අයත් නිල නිවාස වල පදිංචි වී සිටි නිලධාරින් 33 ක් විසින් අවුරුදු ගණනාවක් සඳහා කුලිය ගෙවා නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට රු.256,928 ක් හිඟ හිට පැවතිණි. එනමුත් එම හිඟ මුදල් අයකර ගැනිම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

ii. සාප්පු හිමියන් කිහිප දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු හිඟ කුලිය රු.11,854,420 ක් විය. එනමුත් වසර පහකටත් අධික කාලයක් තිස්සේ එම හිඟ කුලි මුදල් අයකර ගැනිම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

(අ) සභාවට අයත් ගාන්ධි නගර් හි පිහිටි ඉඩමක් පුද්ගලයින් 288 ක් විසින් අනවසරයෙන් අල්ලා ගෙන තිබුණි. කෙසේ වෙතත් අදාල බලධාරින්ගෙන් අනුමැතියක් ලබා නොගෙන සභාව විසින් අනවසරයෙන් ඉඩම අල්ලාගත් පුද්ගලයන්ට 2008 වසර තුලදි ඔප්පු නිකුත් කර තිබුණි.

(ආ) සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගණනය කිරිමේදි සේවකයන්ගේ දළ වැටුප් සැලකිල්ලට ගත යුතු වු නමුත් අනියම් සේවකයන් එකසිය දෙදෙනෙකුගේ සේවක අර්ථ සාධක අරමුදල් ගණනය කිරිමේදී සභාව විසින් මුලික වැටුප් පමණක් සැලකිල්ලට ගෙන තිබුණි. එය හේතුකොට ගෙන ගණනය කොට ප්‍රේෂණය කළ දායක මුදල සහ ගෙවිය යුතු දායක මුදල අතර රු.1,525,665 ක වෙනසක් විය.

(ඇ) භාණ්ඩ සමික්ෂණ මණ්ඩලය විසින් සිදු කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරිම.

-------------------------------------------------------------------------------------

i. 2014 ඔක්තෝබර් 21 දින පවත්වන ලද භාණ්ඩ සමික්ෂණ මණ්ඩලය විසින් භාණ්ඩ විෂයයන් 589 ක් විකිණිමටත් භාණ්ඩ විෂයයන් 51 ක් බැහැර කිරිමටත් නිර්දේශ කර තිබු නමුත් එම නිර්දේශ මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.

ii. 2014 ඔක්තෝබර් 21 දින පවත්වන ලද භාණ්ඩ සමික්ෂණයේදි ගබඩා විෂයයන් 111 ක සහ පුස්තකාල පොත් 4293 ක ඌනතාවයක් අනාවරණය වී තිබු නමුත් ඒ පිළිබඳ වගකිවයුතු නිලධාරින්ට එරෙහිව අවශ්‍ය කටයුතු කළමනාකාරිත්වය විසින් සිදුකර නොතිබුණි.

(ඇ) කාරක ප්‍රාග්ධන කළමනාකරණය

---------------------------------------

2013 වර්ෂයේ සෑම මසක් අවසානයේදි රුපියල් මිලියන 16 සිට රුපියල් මිලියන 47 ක අතර වූ පරාසයක බැංකු ශේෂයක් පොලී ඉපැයෙන බැංකු ගිණුමක ආයෝජනය කිරීමෙන් තොරව ජංගම බැංකු ගිණුමක රඳවාගෙන තිබුණි.

3.2 අක්‍රිය සහ ඌන උපයෝජිත වත්කම්

------------------------------------------ .

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) සභාවට අයත් වාහන 25 ක් අළුත්වැඩියා කිරිමට හෝ බැහැර කිරිමට කටයුතු කිරීමෙන් තොරව වසර 01 සිට 05 දක්වා කාල පරාසයක් තිස්සේ අක්‍රියව සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

(ආ) රුපියල් 946,964 ක පිරිවැයකට 1999 වසරේදි තනන ලද වැඩිහිටි නිවාසයක්, අපේක්ෂිත අරමුණ සඳහා යොදා නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි.

3.3 අනාර්ථික ගණුදෙනු

-------------------------

දායක මුදල් නියමිත කාලය තුලදි ප්‍රේෂණය නොකිරිම හේතුකොට ගෙන රු.1,477 ක අධිභාරයක් සේවක භාරකාර අරමුදලට ගෙවා තිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------------

3.4.1 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------------

සභාව විසින් අපද්‍රව්‍ය බැහැර කිරිමේ යන්ත්‍රෝපකරණ තැනීම් වලට අදාල කොන්ත්‍රාත්තුවක්, රු.3,202,125 ක කොන්ත්‍රාත් වටිනාකමකට 2012 ජනවාරි 28 දින ප්‍රදානය කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණ සිදු කෙරේ.

(අ) අදාල බලධාරින්ගෙන් අනුමැතිය ලබා ගැනිම වැලැක්වීමේ අරමුනෙන් අපද්‍රව්‍ය බැහැර කිරිමේ යන්ත්‍රෝපකරණ ඉදිකිරිම් වලට අදාල සම්පූර්ණ කොන්ත්‍රාත් කටයුතු කොටස් දෙකකට වෙන් කර තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් ගිවිසුම් කඩකළහොත් ආයතනය ආරක්ෂා කිරිම සඳහා ප්‍රසම්පාදනලාභි ආයතනය විසින් කොන්ත්‍රාත් ඇස්තමේන්තුවේ වටිනාකමින් සියයට 5 ට නොඅඩු කාර්ය සාධන ඇපකරයක් ලබාගත යුතු වේ. එනමුත් සභාව කාර්ය සාධන ඇපකරයක් ලබා නොගෙන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. එම නිසා 2014 අගොස්තු මස දී කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තු වැඩ අත්හැර තිබු නමුත් සභාවට කොන්ත්‍රාත්කරුට එරෙහිව කටයුතු කිරිමට නොහැකි වි තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 වගන්තිය ප්‍රකාර ආරක්ෂණ බැඳුම්කරයක් ලබා නොගෙන කොන්ත්‍රාත්කරුට රු.1,000,000 ක වැඩ ආරම්භ කිරිමේ අත්තිකාරමක් ගෙවා තිබුණි.

(ඈ) රු.1,850,150 ක් වු බිල්පත් සඳහා ගෙවිම් ලබා ගැනීමෙන් පසු කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුව අත්හැර දමා තිබුණි. එනමුත් වැඩ ආරම්භ කිරිමේ අත්තිකාරම ආපසු අයකර ගැනිම සඳහා සභාව විසින් කොන්ත්‍රාත්කරුට එරෙහි නෛතික කටයුතු සිදුකර නොතිබුණි.

3.4.2 අලි විදුලි වැටක් ඉදිකිරිම

--------------------------------

2014 ජුනි 20 දින සභාව විසින් ඝන අපද්‍රව්‍ය බැහැර කිරිම් භූමිය වන අලින්ගෙන් ආරක්ෂා කර ගැනිමට එම භූමිය වටා විදුලි වැටක් ඉදිකිරිම සඳහා රු.893,060 ක් වටිනාකමැති කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණ සිදු කෙරේ

(අ) කොන්ත්‍රාත්කරු විසින් පහත සඳහන් වැඩ විෂයයන් ඉටුකර නොතිබු නමුත් එම විෂයයන් සතුටුදායක අන්දමින් නිමකර ඇති බවට සහතික කරමින් එම අසම්පූර්ණ වැඩ සඳහා එකතුව රු.197,700 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

| වැඩ විෂය | ඒකක සංඛ්‍යාව | ගෙවු මුදල |
|---|---|---|
| | | රු. |
| ඇම්පියර් 90 සෝල ඇම්පියර් | 02 | 110,000 |
| අකුණු සන්නායකය | 02 | 22,000 |
| කොකු සහිත ගැල්වනයිස් කලම්ප | 03 | 5,700 |
| පිරික්සුම් මාපක | 03 | 60,000 |
| | | 197,700 |

(ආ) පිරිවිතර වලට අනුව කොන්ත්‍රාත්කරු විසින් කි.වො.7.5 ධාරිතාවෙන් යුක්ත සූර්ය ශක්තිකරණ සවිකළ යුතු වේ. එනමුත් කොන්ත්‍රාත්කරු විසින් කි.වො.1 ධාරිතාවයෙන් යුක්ත සූර්ය ශක්තිකරණ සවිකර තිබූ නමුත් පිරිවිතර වල සඳහන් පරිදි රු.160,000 ක ගෙවීම් කර තිබුණි. සූර්යශක්තිකරණ නිසි ආකාරයෙන් නොතබා තාවකාලික මඩුවක වහලය මත තබා තිබූ බවද තවදුරටත් නිරික්ෂණය විය.

(ඇ) පිරිවිතර හා සැලසුම් වලට අනුව වැට ඉදිකිරිම සඳහා සකස් කරන ලද ලී කණු දෙකක් අතර දුර ප්‍රමාණය මීටර් 4 ක් වියයුතු නමුත් කොන්ත්‍රාත්කරු විසින් මීටර් 33 දුරකින් යුතුව ලී කණු හිටුවා තිබුණි. ඒ හේතුකොට ගෙන තෙකලා වයර් (Three Phase wire ) එකිනෙකට ස්පර්ශ වෙමින් පැවතිණි.

(ඇ) විදුලි වැටට විදුලි සැපයුම ලබා නොදිම හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් සකස් කර තිබූ ලී කණු බොහොමයක් ඒවා සකස් කල දින පටන් වන අලි විසින් හානිකර තිබුණි.

3.4.3 කොම්පෝස් පොහොර නිෂ්පාදනය කිරිම.

---

ත්‍රිකුණාමලය නගර සභාව සහ ප්‍රාදේශිය සභාව, නගරය සහ අවට ප්‍රදේශ විසින් එකතු කරනු ලබන අපද්‍රව්‍ය ප්‍රමාණය වසරකට දල වශයෙන් මෙට්‍රික් ටොන් 19,350 ක මුළු බර ප්‍රමාණයක් වූ අතර ඒවා කන්නියා පිහිටි අපද්‍රව්‍ය බැහැර කිරිමේ ස්ථානයට රැස්කර තිබුණි. එනමුත් එම ද්‍රව්‍ය සැකසීම සඳහා නගර සභාව විසින් 2015 මාර්තු 17 විගණිත දිනය වනතෙක්ම කිසිදු ක්‍රියා පිළිවෙතක් ගෙන නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

---

අනුමත හා තත්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳව 2013 දෙසැම්බර් 31 දිනට අදාල තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විධායක ශ්‍රේණිය | 03 | 01 | 02 | - |
| ද්විතීය ශ්‍රේණිය | 70 | 55 | 15 | - |
| සුළු සේවක | 171 | 159 | 12 | - |
| වෙනත් (අනියම්/ තාවකාලික) | - | 88 | - | 88 |
| එකතුව | 244 | 303 | 29 | 88 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ සිදුකෙරේ.

(අ) සභාවේ ලේකම් සහ ගණකාධිකාරි වැනි ප්‍රධාන තනතුරු පිළිවෙලින් 1996 සහ 2007 වසර වල පටන් පුරප්පාඩුව තිබූ නමුත් එම තනතුරු වලට ස්ථිර නිලධාරින් පත් කිරිමෙන් තොරව ලේකම් තනතුරේ සහ ගණකාධිකාරි තනතුරේ රාජකාරි වැඩ බලන පදනමින් පත් කරනු ලැබූ නිලධාරින් විසින් ඉටුකර තිබුණි.

(ආ) සෞඛ්‍ය පරික්ෂක, වින්නඹු, මහජන සෞඛ්‍ය පරික්ෂක, පරිවර්තක, කාර්මික නිලධාරි, පුස්තකාල භාරකරු, ආදායම් පරික්ෂක, වෙළඳ පොල අධීක්ෂක, මෝටර් කාර්මික සහ රියදුරු තනතුරු පුරප්පාඩු 2015 මාර්තු 15 විගණිත දින දක්වාම සම්පූර්ණ කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) ස්ථාවර වත්කම් පාලනය
(ඉ) තොග පාලනය
(ඊ) මානව සම්පත් කළමනාකරණය
(උ) කොන්ත්‍රාත් පරිපාලනය